**සබරගමුව පළාත් සභාව - 2021**

**--------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**----------------------------**

සබරගමුව පළාත් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2022 සැප්තැම්බර් 30 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ඔක්තෝබර් 12 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා වන පදනම ඡේදයෙහි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර සබරගමුව පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට සබරගමුව පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**------------------------------------------**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ----------------------------------- | ------------ |
| (අ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අදාළව ජංගම නොවන වත්කම් රු.286,556,686 කින් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම වෙනස 2022 වර්ෂයේදී නිවරදි කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දීමට සටහන් කර ගෙන ඇත. | ජංගම නොවන වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු ය. |
| (ආ) | ඉකුත් වර්ෂයේ අවසානයට පැවති ගිණුම් ශේෂ 03 කට අදාළව සිදු කර තිබුණු එකතුව රු.73,363,162 ක් වූ වැරදි නිවැරදි කිරීම්වලින් වන බලපෑම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සංසන්දනාත්මක වටිනාකම්හි දක්වා නොතිබුණි. | 2021 වර්ෂයේ අවසාන ගිණුම් සැකසීමේ දී 2020 විගණනය කරන ලද සංඛ්‍යා සංසන්ධනාත්මක ලෙස ඉදිරිපත් කර ඇත. එසේ වුවද ඉදිරියේදී නිවැරදි කිරීම් කරන අවස්ථාවලදී නිවැරදි කල අගයන් සංසන්ධනාත්මකව ඉදිරිපත් කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව ඉදිරිපත් කළ යුතු ය. |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව සබරගමුව පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.
- අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය සැලකිල්ලට ගන්නා නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම,

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.5.1 ශීර්ෂය 804 - ප්‍රධාන ලේකම්

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සබරගමුව පළාත් සහා සංකීර්ණය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් රු.11,136,000 ක (බදු ඇතුළු) තක්සේරු වටිනාකමට ලබාදීමට 2001 වර්ෂයේ දී නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය හා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබුණි. එහෙත් ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් 2001 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා වාරික ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් රු. 2,255,027 ක මුදලක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණු අතර විෂයය භාර නිලධාරීන්ගේ නොසැලකිල්ල මේ සඳහා හේතු වී තිබුණු බව විගණනයේ දී නිරීක්ෂණය විය. | රු.2,308,044 ක පොළී මුදල ඉවත් කර දෙන ලෙස නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉල්ලීම් කළද එය කළ නොහැකි බව දන්වන ලද අතර ගෙවීම් කිරීමට ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබුණු අතර ඉඩමේ පරම අයිතිය ලබා ගැනීමෙන් පසු ඉඩම පවරා දීමට කටයුතු කරන බව නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂකගේ 2022 අප්‍රේල් 01 දිනැති ලිපියෙන් දන්වා ඇත. | රජයට වූ පාඩුව අයකර ගැනීමටත් අයිතිය පවරා ගැනීම කඩිනමින් සිදු කිරීමටත් කටයුතු කළ යුතුය. |

### 1.5.2 ශීර්ෂය 808- නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා)

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| "ළඟම පාසල හොඳම පාසල" ව්‍යාපෘතිය යටතේ 2016 සිට 2019 කාල පරිච්ඡේදය තුළ ආරම්භකර තිබූ ගිවිසුම්ගත වටිනාකම රු.188,985,906 ක් වූ කෑගල්ල විධායක ඉංජිනේරු කාර්යාලය විසින් අධීක්ෂණය කරනු ලබන ව්‍යාපෘති 11 ක ඉදිකිරීම් කටයුතු , ඉදිකිරීම් භූමිවල ගැටළු, කොන්ත්‍රාත්කරුවන් වෙත කොටස් මුදල් ගෙවීමේ ප්‍රමාදයන් වැනි හේතු මත සමාලෝචිත වර්ෂය වනවිට ඇණහිට තිබුණි. | විවිධ හේතූන් මත මෙම කර්මාන්තවල ඉදිකිරීම් අවසන් වී නැති අතර, මේ පිළිබඳව ගිවිසුම් බලධාරීන් දැනුවත් කර ඇත. | ගිවිසුම්ගත කාලය තුළ අදාළ ව්‍යාපෘති නිමකිරීමට කටයුතු කළ යුතු ය. |

**1.5.3 ශිර්ෂය 809- පළාත් ආදායම් දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 ජනවාරි 01 දිනට 1991 – 2019 අතර කාල සීමාවට අදාළව සබරගමුව පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් අයකර ගත යුතුව පැවති හිඟ බදු වටිනාකම රු. 20,752,999 ක් වූ අතර 2021 දෙසැම්බර් 31 දින වන විට ඉන් අයකර ඇති වටිනාකම රු.2,285,345 ක් එනම් සියයට 11 ක් තරම් පහළ මට්ටමක පැවතුණි. සබරගමුව පළාත් මූල්‍ය රීති 116.3 ප්‍රකාරව හිඟ බදු අය කිරීමේ ප්‍රමාදයන් පිළිබඳ පළාත් ආදායම් කොමසාරිස් විසින් ප්‍රධාන ලේකම් වෙත වාර්තා කළ යුතු වුවද, එසේ කටයුතු කර නොතිබුණි. | අර්ධ වාර්ෂික හිඟ ආදායම් පිළිබඳ වාර්තා ඉදිරියේ දී පළාත් මූල්‍ය රීති 116.3 අනුව ප්‍රධාන ලේකම් වෙත ද පිටපතක් යොමු කිරීමට කටයුතු කෙරේ. | මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කිරීමටත් හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය . |

**1.5.4 ශිර්ෂය 810- නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමූපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන, වතු සුභ සාධන, පරිසර, ප්‍රවෘත්ති, නිවාස හා ඉදිකිරීම් සහ ආගමික කටයුතු අමාත්‍යාංශය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශය යටතේ පැවති ජීප් රථයක් 2017 සැප්තැම්බර් 05 දින හදිසි අනතුරකට භාජනය වී තිබුණු අතර, රථය අලුත්වැඩියාව සඳහා දේශීය නියෝජිත ආයතනය වෙත යොමු කර තිබුණ ද, නියෝජිත ආයතනය විසින් අලුත්වැඩියාව ප්‍රතික්ෂේප කර එය පූර්ණ හානි වූ රථයක් ලෙස සලකා කටයුතු කිරීම යෝග්‍ය බව දන්වා තිබුණි. ඒ අනුව පූර්ණ හානි පදනම මත රක්ෂණ සමාගම වෙත පවරා දෙන්නේ නම් රු. මිලියන 25 ක රක්ෂණ වන්දියක් ලබාදීමට රක්ෂණ සමාගම විසින් එකඟ වී තිබිය දී ප්‍රධාන ලේකම් විසින් රථය අලුත්වැඩියා කිරීමට තීරණය කර තිබුණි. තවද, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය කරමින් සුදුසු ආයතනයක් තෝරා ගැනීම වෙනුවට සෘජුවම | ජීප් රථයේ අළුත්වැඩියා කටයුතු බොහෝමයක් අවසන් කර ඇති අතර අදාළ ආයතනය තෝරා ගැනීමට සම්බන්ධ තොරතුරු ප්‍රධාන ලේකම් වෙතින් ඉල්ලීම් කර ඇත. | 1. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතු අතර, නිලධාරීන් විසින් අනාර්ථික තීරණ නොගත යුතු ය.<br><br>2. කඩිනමින් අළුත්වැඩියා කටයුතු සිදුකරවාගෙන රක්ෂණ සමාගමෙන් අදාල මුදල් පියවා ගත යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | පෞද්ගලික ආයතනයක් වෙත වාහනය භාර දී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසානය වන විට අලුත්වැඩියා කටයුතු නිමකර නොතිබුණි. අලුත්වැඩියාව සඳහා ඇස්තමේන්තුවක් ද පිළියෙල කර නොතිබුණි. | | |
| (ආ) | සබරගමුව පළාතේ පළාත් පාලන ආයතන නිෂ්පාදනය කරන කොම්පෝස්ට් පොහොර වගා සඳහා උචිත ලෙස ප්‍රමිතිගතව සංවර්ධනයට අවශ්‍ය උපකරණ මිල දී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී ප්‍රධාන අමාත්‍යාංශය වෙත පරිපූරක මුදල් ප්‍රකාශයක් මඟින් රු.මිලියන 100 ක් අනුමත කර තිබුණි. ප්‍රධාන අමාත්‍යාංශය විසින් 2021 දෙසැම්බර් 31 දින එම ප්‍රතිපාදනයෙන් රු.9,500,000 ක් වැයකර කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනයට අදාළ නොවන නොදිරන කසළ කළමනාකරණය සඳහා අවශ්‍ය උපකරණ 10 ක් මිල දී ගෙන තිබුණි. තවද පළාත් පාලන ආයතන 10 කට එම යන්ත්‍ර ලබා දී තිබුණ ද තෙකලා විදුලි සම්බන්ධතාවය නොතිබීම හේතුවෙන් 2022 සැප්තැම්බර් 22 දින තෙක්ම එම යන්ත්‍ර උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි. | මේ වන විට එම යන්ත්‍ර 10 පළාත් පාලන ආයතන වෙත භාරදී ඇත. | ප්‍රතිපාදන සපයාගෙන තිබූ අරමුණු වෙනුවෙන් මුදල් වැය කළ යුතු අතර, වැයකළ මුදලින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ඇ) | 2017 සිට 2020 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ ප්‍රධාන අමාත්‍යාංශය විසින් එකතුව රු.6,376,906 ක් වැයකර ඉදිකර තිබුණු ප්‍රජා ජල ව්‍යාපෘති 05 ක තෙකලා විදුලිය නොමැතිවීම, ජල මෝටරය හා ජලය රඳවා ගැනීමේ ටැංකිය ඇස්තමේන්තුවට ඇතුළත් නොකිරීම යනාදි අඩුපාඩු හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විට ද අදාළ ප්‍රතිලාභීන්ට පානීය ජලය ලබාදීමට අපොහොසත්ව තිබුණි. | ජල ව්‍යාපෘතිවල අඩුපාඩු සම්පූර්ණ කිරීම සඳහා 2022 සංවර්ධන සැලැස්මට ඇතුළත් කිරීම හා විදුලි අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය කටයුතු කර ඇත. | ව්‍යාපෘති සැලසුම් කිරීමේ දී නිවැරදිව අවශ්‍යතා හඳුනා ගතයුතු අතර, පවත්නා අඩුපාඩු කඩිනමින් සම්පූර්ණ කර අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතු ය. |

**1.5.4.1 මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආදායම් විෂයයන් 05 ක උපලේඛන අනුව 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ශේෂවල එකතුව රු. 26,714,713 ක් විය. එම ශේෂය තුල වසර 01 ට වැඩි ශේෂය රු.13,524,646 ක් වූ අතර එම ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2020 හා 2021 වර්ෂවල පැවති කොවිඩ් 19 තත්ත්වය නිසා මෙම මුදල් අයකර ගැනීමට නොහැකිව හිඟව පැවතුණ බවත් 2022 වර්ෂයේදී මෙම හිඟ ශේෂයන් විශාල ප්‍රමාණයක් අයකර ගැනීමට කටයුතු යොදා ඇත. | අයවිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | දිස්ත්‍රික් කළමනාකරු, ගිණුම් සහකාර, ධාවන කළමණාකරු, සුභසාධන නිලධාරී හා මුරකරු යන තනතුරු අනුමත කර ගැනීමට කටයුතු නොකර එම තනතුරු සඳහා 10 දෙනෙකු බඳවාගෙන වැටුප් ගෙවා තිබුණු අතර තනතුරු 03 ක අනුමත ප්‍රමාණයට වැඩියෙන් 57 දෙනෙකු බඳවාගෙන තිබුණි. | තනතුරු අනුමත කර ගැනීමට මුදල් කොමිෂම හරහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. | තනතුරු අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | අංක ඩීඑම්එස්/එස්ජී/0505 හා 2017 මැයි 29 දිනැති කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියේ 3 වගන්තිය ප්‍රකාරව තනතුරු සඳහා බඳවා ගැනීම අදාල ආයතනයේ ආදායමින් වැටුප් ගෙවීමේ පදනම මත සිදුකල යුතු බව දක්වා තිබුණද, එයට පටහැනිව 2021 වර්ෂයේ අයවැය හිඟය පියවා ගැනීම සඳහා අනුමත කාර්ය මණ්ඩලය සඳහා වැටුප් ගෙවීමට මාසිකව වැයවන මුදල ප්‍රධාන අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි. | මුදල් කොමිෂන් සභාව විසින් නිලධාරීන් 118 ක් අනුමත කර ඇති බවත් එම නිලධාරීන් සඳහා වැටුප් ගෙවීමට ප්‍රධාන අමාත්‍යාංශය මාර්ගයෙන් මුදල් වෙන් කෙරේ. | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව කටයුතු කළ යුතුය. |

**1.5.4.2 සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 ජුලි 19 දිනැති අංක DMS/SG/0504 දරන කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියේ 02 ඡේදය ප්‍රකාරව | 2021 වර්ෂයේ ආදායම් තරමක් පහත වැටුණු බැවින් ගරු ආණ්ඩුකාරතුමාට කරුණු පැහැදිළි කිරීමෙන් පසුව මෙකී ප්‍රදානය ලබා දී | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව කටයුතු කළ යුතු ය. |

| | | |
|---|---|---|
| උපයන ආදායමින් වැටුප් ගෙවීමේ පදනම මත අධිකාරියේ කාර්ය මණ්ඩලය අනුමත කර තිබුණ ද සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරියේ කාර්ය මණ්ඩලයට පුද්ගලික පඩිනඩි ගෙවීම සඳහා සමාලෝචිත වර්ෂය තුල දී ප්‍රධාන අමාත්‍යාංශය විසින් රු.6,000,000 ක් ප්‍රදානයක් වශයෙන් ගෙවා තිබුණි. | ඇත. | |

**1.5.4.3 පින්නවල ඉපැරණිගම තේමා උද්‍යානය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 අංක 01 දරන පින්නවල ඉපැරණිගම තේමා උද්‍යානය ප්‍රඥප්තියේ 25.1 වගන්තිය ප්‍රකාරව තේමා උද්‍යානය ආදායම් උත්පාදන මට්ටමට ලඟාවන තෙක් එය පවත්වාගෙන යාම සඳහා පළාත් සභා අරමුදල මගින් ආරම්භක ප්‍රාග්ධනයක් ලබා දිය හැකි අතර, 25.3 වගන්තිය ප්‍රකාරව තේමා උද්‍යානයේ ආදායම් උත්පාදන ක්‍රියාවලියේ බිඳ වැටීමක් හෝ මූල්‍ය දුෂ්කරතා පැන නඟින අවස්ථාවලදී මාස 06 ක කාලයක් සඳහා ප්‍රමාණවත් වන පරිදි වැටුප් හා නඩත්තු සඳහා සබරගමුව පළාත් අරමුදලින් සමාන වාරික 10 කින් ගෙවා නිම කළ යුතු ණය මුදලක් පොලී රහිතව ලබා දීමට සබරගමුව පළාත් සභාවට කටයුතු කළ හැකි ය. ඒ අනුව ප්‍රධාන අමාත්‍යාංශය විසින් තේමා උද්‍යානයේ වැටුප් හා දීමනා ගෙවීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකතුව රු.7,529,920 ක අත්තිකාරම් ගෙවා තිබු අතර, එම මුදල අයකරගැනීමකින් තොරව ප්‍රධාන අමාත්‍යාංශයේ වියදමක් වශයෙන් ගිණුම්ගත කර අත්තිකාරම් පියවා ගෙන තිබුණි. | රටේ පැවති වාතාවරණය අනුව සංචාරක කර්මාන්තය සම්පූර්ණයෙන්ම බිඳ වැටීම සමග ණය ලබාගෙන කෙටි කාලයක් තුළදී එය ගෙවා නිම කළ හැකි වාතාවරණයක් ආයතනය තුළ නොපැවතීමේ හේතුව මත සහ තව දුරටත් රටේ පවතින වාතාවරණය යටතේ ආයතනයේ ඉදිරි පැවැත්ම උදෙසා 2016 අංක 01 දරන පින්නවල ඉපැරණිගම තේමා උද්‍යානය ප්‍රඥප්තියේ 25.1 උප වගන්තියෙන් සැලසී ඇති ප්‍රතිපාදන ප්‍රකාරව ගරු ආණ්ඩුකාර තුමාගේ අනුමැතිය මත ආයතනය වෙත පළාත් සභා අරමුදල මගින් එකී මූල්‍ය ප්‍රතිපාදනය ලබා දෙන ලද අතර එම මූල්‍ය ප්‍රතිපාදනය මගින් ආදායම් තත්ත්වය අයහපත් වීම වීම මත පියවීමට නොහැකි වූ සියලු අත්තිකාරම් පියවීමට කටයුතු කර ඇත. | ප්‍රඥප්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

### 1.5.5 ශීර්ෂය 811- සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රත්නපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් රත්නපුර දිස්ත්‍රික්කයේ රෝහල් හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල ඇතුළු සෞඛ්‍ය ආයතනවල ප්‍රධානීන් වෙත අත්තිකාරම් ලබා දී ඉටු කරන ලද අලුත්වැඩියා කටයුතු සම්බන්ධයෙන් විගණනය විසින් නියැදි පදනමින් ආයතන 07 ක සිදු කළ භෞතික පරීක්ෂාවේ දී අභ්‍යන්තර පාලන ක්‍රමවේදවල පැවති දුර්වලතා හේතුවෙන් ඉන් ආයතන 05 ක සිදුකර තිබුණු අලුත්වැඩියාවන් හි දී ශ්‍රමිකයින් යොදාගත් බව සාවද්‍ය ලෙස දක්වමින් ශ්‍රම සැපයුම්කරු විසින් දෛනික වැටුප් රු.1,048,550 ක් වැඩිපුර ලබාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. | සෘජු පදනම මත කරනු ලබන අළුත්වැඩියාවල දී අනුගමනය කළ යුතු ක්‍රමවේදය පිළිබඳව උපදෙස් රත්නපුර දිස්ත්‍රික්කයේ සියලුම සෞඛ්‍ය ආයතන ප්‍රධානීන් වෙත දන්වා ඇති අතර, ඒ අනුව ඉදිරියේ දී කටයුතු කරනු ඇත. දැනට සිදු කර ඇති අළුත්වැඩියා සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර එම වාර්තාව ලද පසුව ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ. | වගකිවයුත්තන්ගෙන් වැඩිපුර ගෙවීම් අයකළ යුතු අතර, හඳුන්වාදී ඇති ක්‍රමවේදය විධිමත් පරිදි ක්‍රියාත්මක වන්නේ ද කියා පසු විපරම් කළ යුතු ය. |
| (ආ) | කෑගල්ල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අනුමත සේවක සංඛ්‍යාව 126 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 219 ක් විය. ඒ අනුව තනතුරු වර්ග 08 ක සේවක පුරප්පාඩු 10 ක් වූ අතර තනතුරු වර්ග 07 ක සේවක අතිරික්තය 103 ක් විය. | සේවා විධිමත්ව පවත්වාගෙන යාම අරමුණු කොට ගෙන මෙම නිලධාරීන් සේවයේ යොදවා ඇති බවත් ඉදිරියේදී අවශ්‍ය පරිදි පුරප්පාඩු සපුරා ගැනීමට හා අතිරික්ත තනතුරු තුලනය කර ගැනීම සඳහා අවධානය යොමු කරනු ලැබේ. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට සහ අතිරික්ත කාර්යය මණ්ඩලය අනුමත කරගැනීමට හෝ වෙනත් සුදුසු ස්ථානයකට අනුයුක්ත කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.6 ශීර්ෂය 813 - සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සබරගමුව පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්ගේ 2014 ජුලි 03 දිනැති අංක 2014/04 දරන චක්‍රලේඛයේ 05 වගන්තිය ප්‍රකාරව සමුපකාර ග්‍රාමීය බැංකු හා වෙනත් මූල්‍ය සේවා සමුපකාර සමිති විසින් ග්‍රාමීය බැංකු සංගම්වල සහ සී/ස සකසුරුවම් හා | සියයට 50 ක් ඉක්මවා අයෝජනය කිරීමට අදාලව සමුපකාර සංවර්ධන ප්‍රාදේශීය නිලධාරීන් විසින් උපදෙස් ලබාදී ඇත. | අධීක්ෂණ නිලධාරීන් විසින් සමිතිවල මූල්‍ය කටයුතුවල පවත්නා දුර්වලතා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකාරීත්වය දැනුවත් කොට අදාල නිවැරදි කිරීම් සිදු කරවිය යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | ණයගනුදෙනු පිළිබඳ සමුපකාර සමිති සංගම්වල ආයෝජන සිදු කිරීමේ දී සමුපකාර සංවර්ධන කොමසාරිස්ගේ අනුමැතිය මත තැන්පතුවලින් උපරිමය සියයට 15 ක් දක්වා පමණක් ආයෝජනය කළ යුතු වුවද, සමිති 21 ක් තැන්පතුවලින් සියයට 16 සිට සියයට 81 දක්වා පරාසයකින් මෙම සමිතිවල ආයෝජනය කර තිබුණි. | | |
| (ආ) | සබරගමුව පළාත් 2007 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 43(ආ) වගන්තිය ප්‍රකාරව සමිතියේ කටයුතුවලට අදාළ ගිණුම් හා සංඛ්‍යාත පිළිබඳ තොරතුරු ඇතුළත් වාර්ෂික අවසාන ගිණුම් හා ශේෂ පත්‍රයක් සෑම ලියාපදිංචිකළ සමිතියක් විසින්ම සකස් කරනු ලැබිය යුතු අතර, එය මුදල් වර්ෂය අවසන් වී මාස 03 ක් ඇතුළත රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතු වුවද, රත්නපුර දිස්ත්‍රික්කයේ ක්‍රියාකාරි සමිති 243 න් සමිති 152 ක් 2020 වසර සඳහා අවසන් ගිණුම් පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණු අතර, ඒ හේතුවෙන් උක්ත ප්‍රඥප්තියේ 44(1) වගන්තිය ප්‍රකාරව එම සමිති වාර්ෂිකව විගණනය කිරීමට ද නොහැකි වී තිබුණි. සමුපකාර සමිතිවල නිලධාරින්හට අවසන් ගිණුම් පිළියෙල කිරීම සම්බන්ධයෙන් අවබෝධය නොමැතිවීම ඊට හේතු වශයෙන් දක්වා තිබුණි. ඒ අනුව සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වන සමුපකාර සමිති පරීක්ෂා කිරීම හා ගිණුම් මෙහෙයවීමට අදාළ දෙපාර්තමේන්තුවේ මෙහෙවර ප්‍රමාණවත් පරිදි ඉටු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | 2022 ජුනි 01 දින වන විට විවිධ සේවා සමුපකාර සමිති 13 ම අවසාන ගිණුම් පිළියෙල කර ඇත. විවිධ සේවා සමුපකාර සමිති හැර අනෙකුත් සමිතිවලින් සමිති කිහිපයක් පමණක් අවසන් ගිණුම් ඉදිරිපත් කර ඇත. | දෙපාර්තමේන්තුවේ මූලික කාර්යයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකර ක්‍රියාත්මක කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2007 අංක 03 දරන සබරගමුව පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තියේ xi පරිච්ඡේදයේ 58(1) වගන්තිය ප්‍රකාරව ලියාපදිංචි කළ සමිතියක ආරවුල් විසඳීමේ බලය රෙජිස්ට්‍රාර්වරයා වෙත හිමිවන අතර, මෙම ආරවුල් විසඳීම සඳහා සමිතිවලින් මුදල් තැන්පත් කිරීම සඳහා ප්‍රඥප්තියේ ප්‍රතිපාදන සලසා නොතිබුණි. එසේ වුවද, දෙපාර්තමේන්තුව විසින් ආරවුල් විසඳීම සඳහා අදාළ සමිති වලින් තීරක ගාස්තුවක් අයකර ආරවුල් විසඳීමෙහි නිරත නිලධාරින් සඳහා තීරක ගෙවීමක් සිදුකරනු ලබන අතර, සමාලෝචිත වර්ෂය තුළ දී එසේ තීරක දීමනා වශයෙන් එකතුව රු.4,276,848 ක් ගෙවා තිබුණි. එහෙත් විගණනය විසින් සබරගමුව පළාත් සභාවේ නීති නිලධාරිගෙන් අදාළ වගන්ති සම්බන්ධයෙන් ලබාගත් අර්ථකථනයට අනුව එසේ තීරක ගාස්තු ගෙවීම අනීතික ක්‍රියාවක් බවට නිරීක්ෂණ ඉදිරිපත් කර තිබුණි. | ආරවුල් විසඳීමේ දී දැරීමට සිදුවන ලිපිද්‍රව්‍ය , තැපැල් වියදම්, ගත වන කාලය හා ආරවුලේ සංකීර්ණත්වය සලකා 2019/08 චක්‍රලේඛය ප්‍රකාරව ගාස්තු අය කරනු ලැබේ. | නීත්‍යානුකූළ නොවන ගෙවීම් සිදු නොකළ යුතු ය. |
| (ඈ) | 2007 අංක 03 දරන සබරගමුව පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තියේ xi පරිච්ඡේදයේ 59 (7) වගන්තිය ප්‍රකාරව උසාවියෙන් අයකර රෙජිස්ට්‍රාර් වෙත ප්‍රේෂණය කරනු ලබන මුදල සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර් විසින් අදාළ තීරණය හෝ තීන්දුව අනුව සුදුස්සක් කළ යුතු ය. නමුත් නඩු කටයුතුවලට අදාළ තීරණ හෝ තීන්දු දෙපාර්තමේන්තුව විසින් ලබාගෙන නොමැති අතර, ලැබෙන උසාවි දඩ මුදලින් සියයට 2 ක් උසාවි බල ගැන්වීමේ කටයුතුවල නියැලී සිටින නිලධාරීන් වෙත දිරි දීමනා ලෙස ලබා දී ඉතිරි සියයට 98 ක මුදල අදාළ සමිති වෙත ප්‍රේෂණය කරනු ලබන බව නිරීක්ෂණය විය. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ දී අදාළ නිලධාරින් වෙත එකතුව රු.1,863,515 ක් දිරි දීමනා | පළාත් සමූපකාර අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ සහිතව ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත උසාවි මඟින් ප්‍රේෂණය කරනු ලබන මුදලින් සියයට 2 ක් උසාවි කටයුතුවල නිරත නිලධාරීන්ට දිරි දීමනාවක් ගෙවා ඇත. | නීත්‍යානුකූල නොවන ගෙවීම් සිදු නොකළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | වශයෙන් ගෙවා තිබුණි. එහෙත් විගණනය විසින් සබරගමුව පළාත් සභාවේ නීති නිලධාරිගෙන් අදාළ වගන්ති සම්බන්ධයෙන් ලබාගත් අර්ථකථනයට අනුව එසේ තීරක දිරි දීමනා ගෙවීම අනීතික ක්‍රියාවක් බවට නිරීක්ෂණ ඉදිරිපත් කර තිබුණි. | | |

**1.5.7 ශීර්ෂය 814 - පළාත් පාලන දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත සහ 2007 මැයි 18 දිනැති SP/CSA/07/07 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව පළාත් පාලන ආයතන සඳහා මහජන ඡන්දයෙන් තේරී පත්වී ඇති නගරාධිපතිවරු, සභාපතිවරු සහ සභිකයන් අදාළ පරිදි පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් හෝ පළාත් පාලන කොමසාරිස් වෙත, තම වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු වුවත්, 2018 වර්ෂයේ පළාත් පාලන මැතිවරණය මගින් පළාත් පාලන ආයතන 29 ක් සඳහා තේරී පත්වූ සභිකයන් 807 දෙනෙකුගෙන්, 805 දෙනෙකු තම වත්කම් හා බැරකම් ප්‍රකාශ 2022 මැයි වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | සියළුම පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින්ගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා ගැනීම සඳහා ලිපි මඟින් විමසීම් කර ඇත. | යොමුගත නීතීන් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.5.8 ශීර්ෂය 820 - පළාත් මාර්ග සංවර්ධනය, ග්‍රාමීය යටිතල පහසුකම්, සංචාරක සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් සංචාරක කර්මාන්තයේ වර්ධනය උදෙසා පළාත හරහා ගමන් ගන්නා දේශීය හා විදේශීය සංචාරකයින්ට පහසුකම් සහිත ස්ථානයක් ඇතිකිරීමේ අරමුණින් | මෙම ගොඩනැඟිල්ල 2011 වර්ෂය දක්වා කුරුවිට ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන ගිය අතර 2015 වර්ෂයේදී සංචාරක ගිමන්හල ක්‍රියාත්මක නොවන | නිසි ශක්‍යතා අධ්‍යයනයකින් පසුව මෙවැනි ඉදිකිරීම් සිදු කළ යුතු අතර මෙම ඉදිකිරීම නිසා රජයට සිදුව ඇති පාඩුව මගහරවා ගැනීමට කටයුතු |

| | | | |
|---|---|---|---|
| | රත්නපුර කොළඹ ප්‍රධාන මාර්ගය ආශ්‍රිතව නාමල්දෙණිය සංචාරක ගිමන්හල 2005 වර්ෂයේදී ඉදිකර තිබුණි. නිසි ශක්‍යතා අධ්‍යනයකින් තොරව ඉදිකර තිබුණු මෙම ගොඩනැගිල්ල සඳහා මාර්ග අමාත්‍යාංශය විසින් 2004 වර්ෂයේ සිට 2021 සැප්තැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුළ එකතුව රු.12,641,235 ක වියදමක් දරා තිබුණු අතර 2005 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා වසර 05 ක කාලයක් පමණක් මෙම ගිමන්හල විවෘතව පැවති අතර වසර 12 ක්ම මෙම ගොඩනැගිල්ල කිසිදු කාර්යයක් සඳහා භාවිතයට නොගෙන වසා දමා තිබුණි. | තත්වයේ පැවති බැවින් අමාත්‍යාංශය වෙත නැවත ලබාගන්නා ලදි .ඉන්පසුව එහි සංවර්ධන කටයුතු ඉටුකර ඇත.<br>2020 අගෝස්තු මාසය තුළදී මෙම සංචාරක ගිමන්හල මාසික බදු කුලී පදනම මත භාහිර පාර්ශවයක් වෙත පිරිනමන ලදි.නමුත් රට තුළ පවතින කොවිඩ් 19 වසංගත තත්වය හමුවේ සංචාරක ක්ෂේත්‍රයට සිදුව ඇති අහිතකර බලපෑම සමග ව්‍යාපාර පාඩු ලබන බැවින් මාස 03 ක කාලයකින් පසුව නැවත අමාත්‍යාංශය වෙත භාර දෙන ලදි.<br>ඉන් පසුව 2021.01.12 දින සිට කුරුවිට ප්‍රාදේශිය සභාවේ ඉල්ලීම මත එම ගොඩනැගිල්ල පවත්වාගෙන යාම සඳහා නැවත කුරුවිට ප්‍රාදේශිය සභාවට භාර දෙන ලදි. කෙසේ වුවත් කොවිඩ් 19 වසංගත තත්වය නිසා සංචාරක පහසුකම් සඳහා භාවිතයට ගැනීමට අසීරු තත්ත්වයකට පත්ව ඇත. | කළ යුතුය. |
| (ආ) | දෙහිඕවිට විධායක ඉංජිනේරු කාර්යාලයේ අධීක්ෂණය යටතේ සපුමල්කන්ද මාර්ගය කි.මී 0 සිට කි.මී 6.2 දක්වා නඩත්තු කිරීමේ කර්මාන්තයේ ඇස්තමේන්තුගත මුදල රු. 2,790,000 ක් වුවද රු.1,385,320 ක කළ වැඩ වටිනාකමක් සහිතව කොන්ත්‍රාත්කරු වැඩ අවසන් කර තිබුණි. අභ්‍යන්තර විගණනය විසින් මෙම මාර්ගය 2021 ඔක්තෝබර් 21 දින භෞතිකව පරීක්ෂාවේදි සමස්ත කර්මාන්තයේ නඩත්තු දුර ප්‍රමාණයෙන් සියයට 50 කට වැඩි ප්‍රතිශතයක් මාර්ගය පළුදු වී තිබුණු බවත් කර්මාන්තයේ නඩත්තු කාල සීමාව තුළ මාර්ගයේ හානිය ඉහළ ගොස් රැඳවුම් මුදලින් නිම කිරීමට නොහැකි තත්ත්වයට අබලන් වී ඇති බවත් නිරීක්ෂණය වී තිබුණි. ඇස්තමේන්තු ගත මුදලට වඩා සියයට 50 කට අඩුවෙන් වැඩ | කර්මාන්තයට අත්‍යවශ්‍ය ඉටු කරවා ගන්නා ලද වැඩ සඳහා පමණක් ගෙවීම් කර ඇත.කර්මාන්තයේ නඩත්තු කාලය 2021/05/06 දින අවසන්ව ඇති අතර ඒ වනවිට මාර්ගයේ ස්ථාන කිහිපයක පමණක් අබලන් තත්ත්ව නිරීක්ෂණය වී ඇත. ඒවා යථාවත් කරන ලෙස කොන්ත්‍රාත්කරු වෙත දැනුම් දී තිබුණ ද විගණිත අවස්ථාව වන විට ද කොන්ත්‍රාත්කරු විසින් එම යථාවත් කිරීම් අවසන් නොකිරීම හේතුවෙන් රැඳවුම් මුදල රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර ඇත. | නිසි පරිදි වැඩ අවසන් නොකරන සහ පෙන්වාදෙන අඩුපාඩු සකස් නොකර රැඳවුම් මුදල් ලබා නොගෙන සිටින කොන්ත්‍රාත් කරුවන් පිළිබඳව සොයාබලා අසාධු ලේඛණ ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අවසන් කිරීම මාර්ගයේ ගුණාත්මකභාවය අඩුවී දරන ලද වියදම අනාර්ථික වීමට හේතු වී ඇති බව නිරීක්ෂණය කෙරේ. | | |
| (ඇ) | දෙහිඕවිට විධායක ඉංජිනේරු කාර්යාලයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කළ නුරිය පොල්ගස්වත්ත පොල්පිටිය (ගෝවල) මාර්ගය කි.මී 0 සිට 2.00 දක්වා නඩත්තු කිරීමේ කර්මාන්තයේ ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 9.2 ක් වූ අතර ගිවිසුම්ගත වටිනාකම රු.මිලියන 6.9 ක් විය. එසේ වුවද වැඩ අවසන් වටිනාකම රු.මිලියන 4.9 ක් විය. මෙම මාර්ගයේ කි.මී 2 ක දුර ප්‍රමාණයකට ඇස්තමේන්තු සකස්කර තිබුණද මාර්ගයේ ආරම්භක මී. 500 ක කොටස මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් ඉටුකරන බව සඳහන් කර ඉතිරි කි.මී 1.5 පමණක් නඩත්තු කර තිබුණි. ජනාධිපතිතුමාගේ දික්ඇල්ලකන්ද ගම පැවති "ගම සමඟ පිළිසඳරක්" වැඩ සටහනේදී මෙම මාර්ගය කාපට් ඇතිරීමට යෝජනා වූ බැවින් ඒ වන විට ඉදිකිරීම් ඉටු කරමින් පැවති කර්මාන්තය, ඉටු කරන ලද වැඩ වලින් අවසන් කිරීමට කටයුතු කිරීම හේතුවෙන් මාර්ගය දැඩිලෙස අබලන්ව දරන ලද වියදම අනාර්ථික වී තිබුණි. | මෙම කර්මාන්තය අවසන් කිරීම සම්බන්ධයෙන් තීරණ ගන්නා ලද ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති ප්‍රගති සමාලෝචන රැස්වීම සිදු කරන අවස්ථාව වන විට මෙම කර්මාන්තය යටතේ ABC Prime කිරීම සිදු කර තිබූ බවත් ABC අතුරා Prime කිරීම තාවකාලික ප්‍රතිකර්මයක් වන බැවින් සාමාන්‍යයෙන් කාලයක් ගතවීමේදී සෝදාපාලුවට ලක්වීම සිදුවන බව. අතිගරු ජනාධිපතිතුමාගේ දික්ඇල්ලකන්ද ගම පැවති "ගම සමඟ පිළිසඳරක්" වැඩ සටහනේදී මෙම මාර්ගය කාපට් ඇතිරීමට යෝජිත බැවින් ඒ වන විට ඉදිකිරීම් ඉටු කරමින් පැවති කර්මාන්තය අතරමග නවතන ලෙස බලධාරීන් විසින් උපදෙස් ලබා දුන් බවත් එබැවින් කර්මාන්තය ඉටු කරන ලද වැඩ වලින් අවසන් කිරීමට කටයුතු කර ඇත. | අත්‍යවශ්‍ය නඩත්තු කර්මාන්ත පිළිබඳව විධායක ඉංජිනේරුවරුන් දැනුවත් වී සිටිය යුතු අතර ඒ පරිදි කොන්ත්‍රාත්කරුවන් වෙත වැඩ පවරා නඩත්තු කටයුතු සිදු කළ යුතු අතර වැඩ නවතා දැමීමෙන් රජයට හා මහජනතාවට සිදුවන පාඩුව අවම වන පරිදි කටයුතු කළ යුතුය. |
| (ඇ) | සබරගමුව පළාත් මාර්ග සංවර්ධනය ග්‍රාමීය යටිතල පහසුකම් සංචාරක, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ කොන්ත්‍රාත්කරුවන් 06 දෙනෙකු වෙත 2021ජුලි 16 සිට 2021 අගෝස්තු 25 අතර කාල පරිච්ඡේදයේදී වැඩ ආරම්භකර 2021 ඔක්තොම්බර් 13 හා 2021නොවැම්බර් 22 දිනට වැඩ අවසන් කල යුතු රු.115,823,454 ක් වූ කොන්ත්‍රාත් 18 ක් ප්‍රදානය කර තිබුණු අතර එම | මෙම කොන්ත්‍රාත්කරුවන්ට ඔවුන්ගේ ලියා පදිංචි කාණ්ඩය අනුව කොන්ත්‍රාත් ප්‍රදානය කරන ලදි.<br>මෙම කොන්ත්‍රාත්කරුවන් ව්‍යාපෘති කරගෙන යාමේදී ඔවුනට බලපෑ ප්‍රායෝගික අපහසුතා (මිල ඉහළ යාම් , අමු ද්‍රව්‍ය හිඟය ආදී ලෙස) සඳහන් කර ව්‍යාපෘති අවලංගු කිරීමට හෝ කල් දිගු ලබා දෙන ලෙසට ඉල්ලීම් ලිපි ඉදිරිපත් කර ඇත. | කොන්ත්‍රාත් ප්‍රදානයේ දී ලියාපදිංචි කාණ්ඩයට අමතරව ප්‍රමාද වීම් , වැඩ පැහැරහැරීම් පිළිබඳව ද අවධානය යොමු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කොන්ත්‍රාත්කරුවන් එයින් 2021 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.46,476,848 ක් වූ කොන්ත්‍රාත් 07 ක වැඩ ආරම්භකර නොතිබුණි. වැඩ ආරම්භ කර තිබූ එකතුව රු.69,346,606 ක් වූ කොන්ත්‍රාත් 11 ක 2021 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 5 සිට සියයට 80 දක්වාද මූල්‍ය ප්‍රගතිය රු. 7,592,760 ක් පැවතුණි. එක් කොන්ත්‍රාත්කරුවෙකු වෙත එකම කාල පරිච්ඡේදයේදි කර්මාන්ත කිහිපයක් ලබාදීම තුලින් මෙම වැඩ ඉටු කිරිම ප්‍රමාදවීම නිරීක්ෂණය වූ අතර නියමිත කාලය තුල වැඩ ඉටු නොකිරීම හේතුවෙන් රාජ්‍ය මුදල් වෙන්කර තිබුණද මහජනතාවට අදාල ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | | |
| (ඉ) | මාර්ග සංවර්ධනය යටතේ 2006 , හා 2007 වර්ෂ වලදී ප්‍රතිපාදන වෙන් කරමින් ආරම්භ කරන ලද කර්මාන්ත ඉටු කිරීම සඳහා අත්තිකාරම් ලෙස ලබා දෙන ලද රු.4,812,643 ක ශේෂය සමාලෝචිත වර්ෂය අවසානය වන විට වසර 14 ක් ඉක්මවා ඇත. මේ පිළිබඳව පසුගිය වසරේ විගණන විමසුම් මගින් දන්වා තිබුණු අතර පිළිතුරුලෙස කොන්ත්‍රාත්කරුට එරෙහිව බේරුම්කරණය වෙත යොමුකිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට යොමුකර ඇති බව දන්වා තිබුණි. මේ දක්වා එම අත්තිකාරම් අයකර ගෙන නොතිබුණි. | කොන්ත්‍රාත්කරුවන් වෙත ලබා දී ඇති අත්තිකාරම් මුදල් පියවා ගැනීම සඳහා අමාත්‍යාංශය වෙත ලබා දී තිබූ ලිපිනයන් වෙත අවස්ථා ගණනාවකදීම දැනුම් දීම් සිදු කර ඇති අතර ඔවුන්ගේ පදිංචිය පිළිබඳ නිශ්චිත තොරතුරු සොයාගැනීමට නොහැකි වී තිබුණි. ඔවුන් විසින්ම පවරන ලද අභියාචනාධිකරණයේ පැවති නඩුවට පවා මෙම කොන්ත්‍රාත්කරුවන් පෙනී නොසිටින ලදී . 2020.07.03 දින මෙම අග්‍රිම පියවා ගැනීම සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි ක්‍රියා මාර්ග පිළිබඳව නීතිපති උපදෙස් විමසන ලදී. එම උපදෙස් අනුව කොන්ත්‍රාත්කරුවන්ට එරෙහිව බේරුම්කරණය වෙත යොමු වීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරිමට නීතිපති සහය ඉල්ලා ඇත. | මෙම අග්‍රිම ලබාදී වසර 14 ක් ඉකුත් වී ඇති බැවින් නීති මඟින් කටයුතු කර රජයට සිදුවී ඇති අලාභය අයකරගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.9 ශිර්ෂය 830- සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අංක අමප/21/1596/304/134 හා 2021 සැප්තැම්බර් 07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය යටතේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද, මුදල් අමාත්‍යවරයාගේ අංක 21/1596/304/134 හා 2021 අගෝස්තු 28 දිනැති "රාජ්‍ය වියදම් සමාලෝචනය" යන මැයෙන් ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශයේ 02 (vi) ඡේදය අනුව මූලධන සංවර්ධන වැඩසටහන් යටතේ වෙන්කර ඇති ප්‍රතිපාදන භාවිතයෙන් සිදුකරනු ලබන විවිධ ද්‍රව්‍ය භාණ්ඩ හා උපකරණ බෙදා දීම් සමාලෝචනය කර ඒවා අත්හිටුවීමට යෝජනා කර තිබුණි. එසේ තිබිය දී "සංවර්ධන සහයන්" වැය විස්තරය යටතේ දෙවන පරිපූරක මුදල් ප්‍රකාශය මගින් ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර, එමගින් රු.11,596,320 ක් වැයකර ස්වේච්ඡා සංවිධානවලට බෙදා දීම සඳහා ප්ලාස්ටික් පුටු, විදුලි ජනක යන්ත්‍ර හා මුළුතැන්ගෙයි උපකරණ යනාදි ය මිල දී ගෙන තිබුණි. | 2021.08.13 වන දින ප්‍රධාන ලේකම් ගේ **CSP/MD/**13 ලිපිය මඟින් අනුමැතිය ලබා දි තිබුණ අතර ප්‍රධාන ලේකම්ගේ අංක **CSP/**10/**SUP/**21 හා 2021.11.07 දිනැති ලිපිය මඟින් ප්‍රතිපාදන අනුමත කර ඇත. | අමාත්‍ය මණ්ඩල තිරණ ප්‍රකාරව කටයුතු කර නොමැති බැවින් අදාල නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**1.5.9.1 කර්මාන්ත සංවර්ධන අධිකාරිය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බලවින්න පෙරනිමි කොන්ක්‍රීට් අංගනයට අදාලව ගිණුම් වර්ෂය අවසාන වන විටත් නිරවුල් නොකළ වසරකට වඩා වැඩි කාලයක සිට පැවත එන ණයගැති ශේෂය රු.5,564,032 ක් විය. | අදාල ණයගැති ශේෂ අයකර ගැනීමට වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර ඇත. | ණයගැති ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |

**1.5.10 ශීර්ෂය 840- අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සහ කලාප අධ්‍යාපන කාර්යාල වලින් සිදු කරනු ලබන 2016 වර්ෂයේ සිට ආරම්භකර මූලික විමර්ෂණය අවසන් නැති අවස්ථා 22 ක් සහ විධිමත් විනය පරීක්ෂණය අවසන් නැති අවස්ථා 04 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් පැවතුණි. | මූලික විමර්ශන සඳහා සිහිකැඳවීම් යොමු කර ඇති අතර විධිමත් විනය පරීක්ෂණ මේ වන විට ආරම්භ කර ඇත. | විනය ක්‍රියාමාර්ග චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කඩිනමින් අවසන් කළ යුතුය. |
| (ආ) | සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද ර/ධර්මපාල මහා විද්‍යාලයේ සිව් මහල් ගොඩනැගිල්ල දෙවන අදියර ඉදිකිරීමේ කර්මාන්තයේ රු.25,922,000 ක් වූ ඇස්තමේන්තුව පිළියෙල කිරීමේ දී එම ගොඩනැගිල්ලේ පළමු අදියර ඉදිකිරීමේ කොන්ත්‍රාත්කරුගෙන් වාචික උපදෙස් මත ඉටුකරවාගෙන තිබූ රු. 4,668,029 ක් වූ වැඩ අයිතම 37 ක් සාවද්‍ය ලෙස ඇතුළත් කොට වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු වෙත ප්‍රදානය කර තිබුණි. ඒ අනුව පළමු අදියර නිමකළ කොන්ත්‍රාත්කරු විසින් ඉටුකළ උක්ත වැඩකොටස් දෙවන අදියර ඇස්තමේන්තුවෙන් ඉවත්කොට සංශෝධනය කිරීමට කටයුතු කරන බව ප්‍රධාන ලේකම් විසින් දන්වා තිබුණ ද 2022 සැප්තැම්බර් 12 දින වන විටත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. මෙය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සහතික විය යුතු 1.2.1 (අ), (ආ) සහ (ඊ) යන මාර්ගෝපදේශයන්ට අනුකූල නොවීමක් ලෙස නිරීක්ෂණය විය. | මෙම දෙවන අදියර සඳහා කොන්ත්‍රාත්තුව පිරිනැමීමෙන් පසුව වැඩ ආරම්භ කිරීමට යන අවස්ථාව වන විට ගොඩනැගිල්ල බිම් මහල පරිහරණය කිරීමට අත්‍යාවශ්‍යයෙන්ම කල යුතු වැඩ කොටස් කිහිපයක් මුල් කොන්ත්‍රාත්කරු විසින් ඉටු කර තිබුණ අතර පාසලේ පවතින දැඩි පන්ති කාමර තදබදය හා පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය, ඡන්ද මධ්‍යස්ථානයක් ලෙසද අදාල ගොඩනැගිල්ලේ බිම් මහළ පාවිච්චි කිරීම සඳහා එසේ සිදු කර තිබුණි. ඉටු කරන ලද වැඩ කොටස්වල මිණුම් ගෙන ගණනය කිරීමේදි කරන ලද වැඩ කොටස් වල වටිනාකම 10% අවිනිශ්චිත මුදල් ද ඉක්මවා ඉටු කර තිබූ බව.<br>පළමු අදියර නිමකළ කොන්ත්‍රාත්කරු විසින් ඉටුකළ උක්ත වැඩ කොටස් සඳහා ගෙවීම් කිරීමටත් දෙවන අදියර ඇස්තමේන්තුවෙන් ඉවත්කොට සංශෝධනය කිරීමටත් කටයුතු කර ඇත.<br>මේවන විට අදාල රක්ෂණාවරනය ලබා ගැනීමටත් ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ යෝග්‍යතා සහතිකය ලබා ගැනීමටත් අවශ්‍ය | 1. කොන්ත්‍රාත් පිරිනැමීමේදී චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු අතර කොන්ත්‍රාත් ඇස්තමේන්තු පිළියල කරන ලද, අනුමත කරන ලද නිලධාරීන් සඳහා විනය ක්‍රියාමාර්ග ගත යුතුය.<br>2. අනුමත ඇස්තමේන්තුවක් නොමැති බැවින් ගෙවීම් කිරීම සුදුසු නොවන අතර, දෙවන අදියර ඇස්තමේන්තුව සංශෝධනය කර ගිවිසුම් ගත වී කඩිනමින් ඉදිකිරීම් කටයුතු නිමකළ යුතු ය.<br>3. රක්ෂණාවරනය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තවද සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2011 පෙබරවාරි 10 දිනැති අංක ජා.ගො.ප.ස 2011/01 දරන ආපදා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛයේ 03 ඡේදය අනුව ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් ලබා ගත යුතු යෝග්‍යතා සහතිකය ලබාගෙන නොතිබුණු අතර, 1982 අංක 04 දරන පනතෙන් සංශෝධිත, 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 23 (v) වගන්තිය ප්‍රකාරව මෙම ඉදි කිරීමට අදාළ ගොඩනැගිලි සැලැස්ම නාගරික සංවර්ධන අධිකාරිය මගින් අනුමත කරගෙන නොතිබුණි. | පියවර ගෙන ඇත. | 4. චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | රේඛීය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2016 වර්ෂයේ සිට ආරම්භ කර ඇති “ළඟම පාසල හොඳම පාසල” ව්‍යාපෘතියට අදාලව ප්‍රමාණවත් පරිදි අක්මුදල් නොලැබීම නිසා කොන්ත්‍රාත් වටිනාකම රු.202,457,148 ක් වූ ව්‍යාපෘති 12 ක් සියයට 05 සිට සියයට 60 දක්වා ප්‍රතිශතයකින් සම්පූර්ණ කර නොතිබුණු අතර අදාල ගිවිසුම්ද අවසන් කර තිබු බව නිරීක්ෂණය විය. | මෙම අමාත්‍යාංශයේ පාලනයෙන් තොර කාරණා හේතුකොටගෙන මෙම කර්මාන්ත සම්පූර්ණ නොකරම අවලංගු කිරීමට සිදු වී ඇත. | පළාත් සභා අරමුදල් යෙදවීමෙන් හෝ ව්‍යාපෘති කඩිනමින් නිම කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.11 ශීර්ෂය 841 - අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 නොවැම්බර් 30 දිනැති අංක ED/08/23/05/13/01 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය අනුව පාසල් පද්ධතියේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කිරීමේ ජාතික ප්‍රතිපත්තියෙහි එක් අංගයක් වශයෙන් 6-11 ශ්‍රේණිවල සිසුන් සඳහා විද්‍යාව, ගණිතය, ඉංග්‍රීසි ආදී | මෙම කාර්යය සඳහා නියෝජ්‍ය විදුහල්පති පත්කර තිබුණ ද ඇය අධ්‍යයන නිවාඩු ලබා ගැනීම විධිමත්ව පාසලට දන්වා නොතිබූ බැවින් අදාළ කටයුතු සඳහා වෙනත් වග කිව යුතු නිලධාරියකු පත් කිරීමට නොහැකි වී තිබුණි. මේ වන විට අදාළ කටයුතු සම්බන්ධීකරණය හා අධීක්ෂණය සඳහා ගුරුභවතුන් 03 දෙනෙකු පත් කර ඇත. | පාසලට ලබා දී ඇති සම්පත් වලින් උපරිම ප්‍රයෝජනයක් සිසුන්ට ලැබෙන පරිදි කාර්යක්ෂමව භාවිතා කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙලක් පාසල සහ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |

විෂයයන් ඩිජිටල් ඉගෙනුම් ආධාරක භාවිතයෙහි ඉගැන්වීම් සඳහා ටැබ්ලට් පරිගණක ලබා දීමේ ව්‍යාපෘතිය යටතේ රේඛිය අමාත්‍යාංශය විසින් රු.3,259,830 ක් වැයකර ගුරුභවතුන් සඳහා ටැබ්ලට් පරිගණක 10 ක් හා සිසුන් සඳහා පරිගණක 95 ක් වශයෙන් ටැබ්ලට් පරිගණක 105 ක් රත්නපුර දිස්ත්‍රික්කයේ පාසැලක් වෙත ලබා දී තිබුණි. එම පරිගණක ව්‍යාපෘතියේ කටයුතු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් පාසැල සමඟ සම්බන්ධීකරණයක් හෝ අධීක්ෂණයක් සිදු කර නොතිබුණු අතර අදාල පරිගණක හා උපාංග හඳුනාගත හැකි පරිදි නොමැකෙන තීන්තෙන් අංකනය කර නොතිබුණි. එසේම 2021 අප්‍රේල් 07 දින ලබා දී තිබුණු මෙම ටැබ්ලට් පරිගණක 105 අතුරින් පරිගණක 50 ක වැඩසටහන් ඇතුළත් කර නොතිබුණු අතර ඒ සඳහා ලබා දී තිබුණු ප්‍රති වෛරස මෘදුකාංග ද අභාවිතව පැවතුණි. මෙම ටැබ්ලට් පරිගණක භාවිතය හා ඉගෙනුම් ඉගැන්වීම් ආධාරකයක් ලෙස යොදා ගැනීම සම්බන්ධයෙන් කිසිදු පුහුණු වැඩසටහනක් පවත්වා නොතිබුණු අතර විද්‍යාව, ගණිතය, හා ඉංග්‍රිසී ආදී විෂයයන් ඩිජිටල් ඉගෙනුම් ආධාරක භාවිතයෙන් ඉගැන්වීම සඳහා දැනුවත්භාවයක් ගුරුවරුන් තුල නොමැති වීම හේතුවෙන් මෙම උපකරණ ලබා දීමෙන් අපේක්ෂා කල අරමුණු මේ වන තෙක් ඉටු වී නොමැති බව විගණනයේ දී නිරීක්ෂණය විය.

### 1.5.12 ශීර්ෂය 851- ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2010 වර්ෂයේ සිට අනවසරයෙන් භුක්ති විඳිනු ලබන රජයේ ඉඩම් කොටස් 05ක් දිර්ඝකාලීන බදු පදනම යටතේ එම පුද්ගලයන් 05 දෙනා වෙත ලබාදීම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා හා අමාත්‍යවරයා විසින් 2018,2019 හා 2021 වර්ෂයන්හිදි අනුමත කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ඉඩම් භුක්ති විඳිනු ලබන පුද්ගලයන් 05 දෙනාගෙන් එකතුව රු.517,706 ක් වූ හිඟ බදු මුදල් අයකර දීර්ඝකාලීන බදුකරයන් ලබාදීමට සබරගමුව පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | බදු මුදල් ගෙවන ලෙස බදුකරුවන් ලිපි මගින් දැනුවත් කර ඇති අතර **04** දෙනෙකු රු.**37,000**ක් ගෙවා ඇත. | හිඟ බදු මුදල් අයකර දීර්ඝකාලීන බදුකරයන් ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |

### 1.5.13 ශීර්ෂය 853 - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පිරිසිදු එළකිරි නිෂ්පාදනය කිරීම සහ කිරි සැකසුම් මධ්‍යස්ථාන ඇති කිරීම හා නවීකරණ කටයුතු කිරීමේ වැඩසටහන් යටතේ රඹුක්කන, දැරණියගල හා බලංගොඩ පශු වෛද්‍ය කොට්ඨාශවල ක්‍රියාත්මක කිරීමට පශු සම්පත්, ගොවිපල සංවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයෙන් අනුමත කර තිබුණු එකතුව රු.1,323,500 ක් වූ ව්‍යාපෘති 22 ක් තෝරාගත් ප්‍රතිලාභීන් විසින් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් ක්‍රියාත්මක නොකර අවලංගු කර තිබුණි. | පැවති වසංගත තත්වය හේතුවෙන් අදාළ භාණ්ඩ වල මිල එකවර ඉහළ යෑම නිසා ඇස්තමේන්තුවේ සඳහන් මූල්‍ය ප්‍රතිපාදන අදාල භාණ්ඩ මිලදී ගැනීමට ප්‍රමාණවත් නොවූ බව හා ඇස්තමේන්තුවෙහි සඳහන් ප්‍රතිපාදන ප්‍රමාණයෙන් අඩු කාපට් ප්‍රමාණයක් ගොවීන් හට ලබා දීම තුළින් අදාළ ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්කය සපුරාගත නොහැකි බැවින් මිලදී ගැනීම් සිදු නොකරන ලදි. | ව්‍යාපෘති අවලංගු නොකර ක්‍රියාත්මක කිරීමට අදාල බලධාරීන් කටයුතු කළ යුතුය. |